HDFC BANK
ඔබේ නිවසේ බැංකුවයි

# HDFC BANK

දශක හතරක කාලයක් පුරා විවිධ මූල්‍ය විසඳුම් හරහා සුවහසක් ශ්‍රී ලාංකිකයන්ගේ  හිසට සෙවණක් මෙන්ම ව්‍යාපාරික ප්‍රජාවට මූල්‍ය සහාය සපයමින් දැයේ අභිවෘද්ධිය උදෙසා කැප වන බැංකුවක් සමඟ ඔබේ බැංකුකරණ වෘත්තීය උසස් තලයකට ගෙන ඒමට මහඟු අවස්ථාවක් උදා වී ඇත.

**HDFC** බැංකුවෙහි පහත සඳහන් තනතුරු සඳහා දක්ෂ, ක්‍රියාශීලි සහ සුබවාදී දැක්මක් සහිත අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## කළමණාකරු - අභ්‍යන්තර විගණන - [ශ්‍රේණිය III (1)]

**වගකීම්**

- බැංකු ශාඛාද ඇතුළු බැංකුවේ සියලු අංශවලට අදාළ විගණන, විමර්ශන හා වෙනත් පැවරුම් නිසි පරිදි සැළසුම් කිරීම සහ ක්‍රියාවට නැංවීම.
- අවදානම් මත පදනම් වූ විගණන සංකල්ප පිළිබඳව අවබෝධ කර ගැනීම සහ බැංකු ක්ෂේත්‍රයේ පවතින මෙහෙයුම් අවදානම් පිළිබඳ දැනුවත් වීම.
- විගණන කණ්ඩායම කාර්යක්ෂමව මෙහෙයවීම, විගණන ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම, අදාළ කාර්ය නියමිත කාල සීමාව තුළ සම්පූර්ණ කර ඇති බව, විගණන විෂය පථය ප්‍රමාණවත් ලෙස ආවරණය කර ඇති බව සහ අදාළ ක්‍රියාවලියට අනුගත වී ඇති බව සහතික කිරීම.
- විගණන සහ විමර්ශන ස්වාධීනව සම්පූර්ණ කිරීම සහ අදාළ වාර්තා සකස් කිරීම.
- පද්ධති, නිෂ්පාදන හා කාර්ය පටිපාටි සංවර්ධනය සහ ප්‍රධාන අභ්‍යන්තර විගණන නිලධාරී විසින් පවරනු ලබන වෙනත් කාර්ය සහ ව්‍යාපෘති සඳහා ක්‍රියාකාරීව දායක වීම.

**සුදුසුකම්**

- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ ((ICASL), වරලත් සහතිකලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (ACCA), සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (CMA), එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (CIMA) සාමාජිකයෙකු වීම.
  හෝ
- පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් මූල්‍යකරණය, ගිණුම්කරණය, වාණිජ්‍යය, ව්‍යාපාර කළමනාකරණය, කළමනාකරණය හෝ ආර්ථික විද්‍යාව පිළිබඳ උපාධියක්.
- බැංකුකරණය පිළිබඳ පූර්ණ වෘත්තීය සුදුසුකම් අතිරේක සුදුසුකමක් වනු ඇත.
- මූල්‍ය සේවා ක්ෂේත්‍රයේ කළමනාකරුවෙකු/සහාය කළමනාකරුවෙකු ලෙස වසර 5ක විගණන අත්දැකීම් ලබා තිබීම.
- තොරතුරු තාක්ෂණය පදනම් කර ගත් විගණන පළපුරුද්ද අමතර සුදුසුකමක් වනු ඇත.
- ගිණුම්කරණ හා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති, ශ්‍රී ලංකා  මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන නිර්දේශ, මාර්ගෝපදේශ සහ වෙනත් අනුකූලතා හා නියාමන අවශ්‍යතා පිළිබඳ පුළුල් දැනුමක් තිබීම.
- මූල්‍ය ආයතනයක ආයතනික පරිපාලන පිළිවෙත් පිළිබඳ දැනුම තිබීම.
- විශ්ලේෂණය කිරීමේ, අර්ථ නිරූපණය කිරීමේ සහ ලිවීමේ විශිෂ්ට හැකියාවක් තිබීම.

**වයස් සීමාව**

- අවුරුදු 45ට අඩු වීම වඩාත් සුදුසු  වේ.

## **විගණන සහකාර (වසර 4ක ස්ථාවර කොන්ත්‍රාත් පදනම මත) -** (පුරප්පාඩු 03කි)

**සුදුසුකම් ලැබීමේ ක්‍රමවේදය**

- අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් ගණිතය හා සිංහල/දෙමළ භාෂා ඇතුළුව සම්මාන 5ක් සහිතව විෂයන් 6ක් සමත් වී තිබීම.
  සහ
- අ.පො.ස. (උ. පෙළ) විභාගය (සාමාන්‍ය ඉංග්‍රීසි රහිතව) සමත් වී තිබීම.
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයෙන් (CA Sri Lanka), එක්සත් රාජධානියේ වරලත් කළමණාකරන ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (CIMA-UK), එකසත් රාජධානියේ වරලත් සහතිකලත් ගණකාධිකාරීවරුන්ගේ (ACCA/UK), ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකාර ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (CMA-SL), ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ (IBSL) අර්ධ සුදුසුකම් ලබා තිබීම.
- විගණනය පිළිබඳව අවම වසර 2ක පළපුරුද්දක් ලබා තිබීම සහ බැංකුකරණ හා මූල්‍ය ක්ෂේත්‍රයේ අත්දැකීම් ලබා තිබීම වඩාත් යෝග්‍ය වේ.
- පරිගණක නිපුණතාව (MS Office)
- විශ්ලේෂනය කිරීමේ හා වාර්තා ලිවීමේ කුසලතාවය අනිවාර්ය වේ.
- දිවයින පුරා ශාඛාවලට යා යුතු වේ.

**වයස් සීමාව**

- අවුරුදු 30ට අඩු වීම වඩාත් සුදුසු වේ.

සිත් ගන්නා වැටුප් සහ දීමනා හිමි වේ.

## රන් සත්‍යාපන නිලධාරීන් (පිරිමි) - ශ්‍රේණිය **IV** (පුරප්පාඩු 03 කි)

මූලික වගකීම්**:**

- රන් භාණ්ඩවල සත්‍යතාව හඳුනා ගැනීම.
- රන් භාණ්ඩ සඳහා නිවැරදි වටිනාකමක් ලබා දී ඇති බවට තහවුරු කිරීම.
- රන් ණය හා සම්බන්ධ ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි, නීති සහ රෙගුලාසි පිළිපැදීම.
- බැංකුවේ රන් ණය කළඹ අදාළ කැරට් අගය සමඟ සහතික කිරීම.
- රන් භාණ්ඩ සත්‍යාපනය සඳහා නිරන්තරයෙන් දිවයින පුරා පිහිටි ශාඛා වෙත යාම අනිවාර්යය වේ.
- රන් භාණ්ඩ නිවැරදි ආකාරයෙන් සේප්පුගත කර ඇති බව සහතික කිරීම.

සුදුසුකම්:

- අ.පො.ස. උසස් පෙළ විභාගය සඳහා සාමාන්‍ය සාමාර්ථ තුනක් ලබා තිබීම. (සාමාන්‍ය ඉංග්‍රීසි හැර)
- උකස් / රන් ණය හා සම්බන්ධ ක්ෂේත්‍රයක වසර පහක පළපුරුද්ද තිබීම.
- රන් ණය විගණන කටයුතු පිළිබඳ පළපුරුද්ද තිබීම.
- රන් සත්‍යාපනය පිළිබඳව පිළිගත් ආයතනයකින් ලැබූ පුහුණු සහතිකයක් අමතර සුදුසුකමක් වනු ඇත.
- පළපුරුද්ද සමඟ රන් භාණ්ඩවල ප්‍රමිතිය සහ ගුණාත්මක බව හඳුනා ගැනීමට හැකියාව තිබීම.
- MS Office පිළිබඳ දැනුම තිබීම.
- ඉංග්‍රීසි සහ දෙමළ භාෂා හැසිරවීමට හැකියාව තිබීම.

වයසස: අවුරුදු 45ට අඩු වීම වඩාත් සුදුසු වේ.

ආකර්ෂණීය වැටුප් සහ දීමනා හිමි වේ.

**අයදුම් කිරීමේ ක්‍රමවේදය**

විද්‍යුත් පණිවිඩයේ විෂය තීරයෙහි (**Subject**) ඉල්ලුම් කරන තනතුර සඳහන් කරමින් 2024.05.15 දින හෝ එදිනට පෙර තමා පිළිබඳ විස්තර ලබා ගත හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුද සඳහන් කරමින් ඔබගේ ඉල්ලුම් පත්‍රය careers@hdfc.lk යන විද්‍යුත් ලිපිනය වෙත යොමු කළ යුතුය.

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන විට ඉල්ලා ඇති සුදුසුකම් සහ පළපුරුද්ද සපුරා නොමැති පුද්ගලයන්ට මෙම තනතුර සඳහා අයදුම් කළ නොහැක. අදාළ සුදුසුකම් සපුරා නොමැති පුද්ගලයන්ගේ අයදුම්පත් සහ අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබුණු අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

සම්මුඛ පරීක්ෂණයේදී අදාළ ලිපි ගොනුවල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් කිසිදු හේතුවක් මත මෙම තනතුර සඳහා පත් නොකෙරෙනු ඇත.

ඕනෑම ආකාරයක බලපෑම් කිරීමක් මෙම තනතුර සඳහා නුසුදුසුකමක් ලෙස සැළැකේ.

බඳවා ගැනීම් කල් දැමීමට හෝ අවලංගු කිරීමට HDFC බැංකුවට හැකියාවක් ඇත. තෝරා ගත් අයදුම්කරුවන් පමණක් බඳවා ගැනීමේ ක්‍රමවේදයේ ඉදිරි අදියර සඳහා කැඳවනු ඇත.


**සහකාර සාමාන්‍යාධිකාරී - මානව සම්පත් හා පාලන**

**HDFC බැංකුව**

**තැ. පෙ. 2085**

**ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාර්ඩිනර් මාවත**

**කොළඹ 02**

**දුරකථන අංකය: 0112356800 වෙබ් අඩවිය: www.hdfc.lk**